**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.15,383 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් නිරවුල් නොකර ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අවිනිශ්චිත ගිණුමේ ශේෂයන් හඳුනා ගෙන නිරවුල් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය රු.6,098,117 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.14,295,535 ක් ලෙස රු.8,197,418 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.87,739,984 ක වත්කම් ගිණුම් විෂයයන් 3 කට හා රු.310,962,383 ක වගකීම් ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ එකතුව රු.398,702,367 ක්, ඊට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂ සමඟ සැසඳීමේදී රු.418,224,872 ක වෙනසක් පැවතුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලට අවශ්‍ය ගැළපීම් කළ යුතුය. |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.307,877,527 ක වත්කම් ගිණුම් විෂයයන් 09 කට හා රු.50,270,669 ක වගකීම් ගිණුම් විෂයයන් 06 කට අදාළව යාවත්කාලීන කරන ලද ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ජල කර්මාන්ත ගබඩා තොග ශේෂය ඉවත් කිරීමට කටයුතු කළ අතර අනෙකුත් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යෑමට කටයුතු කරන බව දන්වා ඇත. | විගණනයට අදාළ සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල්වල ආදායමින් සියයට 1 ක් නොඉක්මවන ගාස්තුවක් ලබාගත යුතු වුවද, සභා බල ප්‍රදේශයේ පිහිටි හෝටලයක් සභාවට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් තොරව 2015, 2016 හා 2017 වර්ෂ සඳහා නියමිත ගාස්තුවට වඩා රු.14,462,640 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි. එසේම 2018, 2019 හා 2020 වර්ෂ සඳහා නියමිත රු.17,033,789 ක ගාස්තුව අයකරගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීමට නඩු පැවරීම සිදුකර ඇති බව දන්වා ඇත. | පනත ප්‍රකාරව සභාවට ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,544,674 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.91,567,788 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු මුදල් සභාවේ අරමුණු ඉටුකර ගැනීමට යොදා ගැනීමට හෝ පනතේ 131 වගන්තිය අනුව ආයෝජනය කිරීමට හෝ කටයුතු නොකර සභාව පවත්වාගෙන යන ජංගම ගිණුමේ රු.11,536,299 සිට රු.73,432,281 ක් දක්වා පරාසයක මුදලක් සමාලෝචිත වර්ෂය පුරා නිෂ්කාර්යව පැවතුණි. | සංවර්ධන ව්‍යාපෘති බොහෝමයක් ඉටු වෙමින් පැවති අතර තවත් ව්‍යාපෘති අවසන් වී තිබූ හෙයින් අදාළ ගෙවීම් කිරීමට මුදල් රඳවාගෙන තිබූ බව දන්වා ඇත. | අතිරික්ත මුදල් සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වරිපනම් හා බදු හිඟය රු.26,922,093 ක් වූ අතර එම හිඟයෙන් වර්ෂය තුළ රු.5,886,533 ක් ද වර්ෂයේ බිල් කිරීම් රු.37,152,599 කින් වර්ෂය තුළ රු.14,763,207 ක් ද වශයෙන් එකතුව රු.20,649,740 ක් අයවීම හේතුවෙන් වරිපනම් අයවීමේ ප්‍රතිශතය සියයට 32 ක් පමණක් විය. ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව හිඟ ශේෂ අයකර නොතිබුණි. | මේ සඳහා බලපා ඇත්තේ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ආදායම් ගෙවීමට සේවාදායකයින්ට අවස්ථාවක් නොලැබීම බව දක්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ආ) | මැණික්හින්න නව වෙළඳ සංකීර්ණ කඩ කාමර 29 කින් සමන්විත වන අතර ඉන් කඩ කාමර 02 ක් 2016 ජූලි 14 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බදු පදනම මත නොදීම හේතුවෙන් රු.239,700 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. එසේම බද්දට දුන් කඩ කාමර 27 න් කඩ කාමර 20 කට අදාළව රු.312,360 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | හිඟ මුදලින් 2022 ජූලි 26 දින වන විට රු.126,310 ක් අයකර ගෙන ඇති බව හා අයවී නොමැති හිඟ අයකර ගැනීමට සිහිකැඳවීම් ලිපි යවා ඇති බව දන්වා ඇත. | හිඟ කඩ කුලී අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කඩ කාමර 33 කින් සමන්විත දිගන බහුකාර්ය ගොඩනැගිල්ල සඳහා 2014 වර්ෂයේ සිදුකරන ලද තක්සේරු අනුව කුලී අය නොකර මහා සභාව යෝජනා කරන ලද ඊට අඩු ගාස්තුවක් අයකිරීම හේතුවෙන් රු.4,187,000 ක පාඩුවක් සභාවට සිදුව තිබුණි. | නව තක්සේරු ලබා ගැනීමට යොමු කර ඇති අතර එය ලැබීමෙන් පසුව ඒ අනුව කඩ කුලී අය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | තක්සේරු කුලිය අය කළ යුතුය. |
| (ඈ) | බලගොල්ල මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා 2014 වර්ෂයේ තක්සේරුව අනුව අදාළ කුලී අයකල යුතු වුවද 2015 පෙබරවාරි 25 දින පැවති මහා සභා තීරණය අනුව ඉහළ මහලේ කඩ කාමර සඳහා රු.500 බැගින්ද පහළ මහලේ කඩ කාමර සඳහා රු.1,000 බැගින්ද අය කිරීමට යෝජනා කර එම කුලිය අයකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,771,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | අහිමි වී ගිය ආදායම සම්බන්ධයෙන් 2021 අගෝස්තු 16 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මඟින් නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බව හා ඒ පිළිබඳව බදුකරුවන් දැනුවත් කර ඇති බව දන්වා ඇත. | නව තක්සේරුවක් ලබාගෙන ඒ අනුව කඩ කුලී අය කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 අනාර්ථික ගනුදෙනු

------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජවැල්ල නගරයේ ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ලබාදී තිබුණු භූමියේ, මහවැලි අධිකාරියේ අනුමැතියෙන් තොරව නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. ඉදිකිරීමේ මූලික කටයුතු වෙනුවෙන් වැයකරන ලද රු.607,063 ක් හා මෙම බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම තහනම් කිරීම සඳහා ප්‍රදේශයේ වෙළඳ සංගම් විසින් කොළඹ අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩුකරය සම්බන්ධව සභාවේ වගකිවයුතු නිලධාරීන් නිසි පියවර නොගැනීම මත ඒ වෙනුවෙන් පෙනී සිටීම වෙනුවෙන් රු.1,500,000 ක නීතිඥ ගාස්තු ගෙවීමට සිදුවීම හේතුවෙන් එකතුව රු.2,107,063 ක නිෂ්ඵල වියදමක් සභාවට දැරීමට සිදුවී තිබුණි. | අධිකරණ තීන්දුව ලබා දීමෙන් පසුව නැවත මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කරන බැවින් ව්‍යාපෘතිය ආරම්භයේදී දරා ඇති වියදම නිෂ්ඵල වියදමක් නොවන බව දන්වා ඇත. | ඉදිකිරීම් සිදු කිරීමට පෙර අදාළ අනුමැතීන් ලබාගත යුතු අතර චක්‍රලේඛ උපදෙස් අනුව ඉඩම්වල අයිතිය නිරවුල් කරගෙන ඉදිකිරීම් සිදුකළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වටිනාකම රු.12,366,000 ක බේල් යන්ත්‍රය හා කසළවල තෙතමනය ඉවත් කිරීමේ යන්ත්‍රය අලුත්වත්ත කසළ අංගනයේ ස්ථාපනය කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද එම යන්ත්‍ර භාවිතයට ගෙන නොතිබුණි. | යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට විදුලි ධාරිතාවය ප්‍රමාණවත් නොවන නිසා ට්‍රාන්ස්ෆෝමරයක් සවිකර ඇති අතර ඒ අනුව විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |